# අපනයනය සඳහා පොල්ලෙලි උපයෝගී කර ගත් නිෂ්පාදනයන් පිළිබඳ සිද්ධි අධ්‍යයනය



සිද්ධි අධ්‍යයනය 2022

සැකසුම : කේ.යූ.අයි විජේවර්ධන

මිනිස්බල සැලසුම්, සංවර්ධන හා පර්යේෂණ අංශය

අපනයනය සඳහා පොල්ලෙලි උපයෝගී කර ගත් නිෂ්පාදන

(සිද්ධි අධ්‍යයනය)

අධ්‍යයනය, දත්ත විශ්ලේෂණය හා වාර්තා සම්පාදනය

කේ.උදිතා ඉරෝෂණී විජේවර්ධන
සංවර්ධන නිලධාරී
ශ්‍රම වෙළඳපොල තොරතුරු හා පර්යේෂණ අංශය

උපදේශකත්වය
අනුෂා ගෝකුල ප්‍රනාන්දු
අධ්‍යක්ෂ ජනරාල්
මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව

මෙහෙයවීම හා අධීක්ෂණය
බී. සුමිත් නිශාන්ත පෙරේරා
අධ්‍යක්ෂ (සැලසුම් හා පර්යේෂණ)
හා
එල්.පී.ලලිත් ගුණරත්න
නියෝජ්‍ය අධ්‍යක්ෂ
ශ්‍රම වෙළඳපොල තොරතුරු හා පර්යේෂණ

සංස්කරණය
බී.සුමිත් නිශාන්ත පෙරේරා
අධ්‍යක්ෂ (සැලසුම් හා පර්යේෂණ)

පිටු සැකසුම

කෝෂලා ගයාත්‍රී දෙහිගස්පිටිය
තොරතුරු තාක්ෂණ නිලධාරී
මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව

# පටුන

1.හැඳින්වීම ........................................................................................ 1

2.පසුබිම ............................................................................................ 2

03.අධ්‍යයනයේ මූලික අරමුණු........................................................................ 3

04.අධ්‍යයනයේ වැදගත්කම............................................................................. 3

05.මෙම ව්‍යාපාරය ආරම්භ කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු............. 3

06.අමු ද්‍රව්‍ය ලබා ගැනීම.................................................................................. 4

07.පොල් ලෙලි කැබලි කරගනු ලබන යන්ත්‍රය සවි කිරීම........................... 4

08.පොල් ලෙලි කැබලි කර ගැනීමට පෙර සකස් කර ගන්නා ආකාරය......... 5

09.කැබලි කිරීමට පොල් ලෙලි සකස් කර ගැනීම ...................................... 5

10.කපනු ලබන පොල් ලෙලි කැබලි ප්‍රමාණ.................................................. 6

11.පොල් ලෙලි කැබලි Wash සහ Unwash කිරීම..................................... 6

12.කපා ගත් පොල් ලෙලි කැබලි වියළන ආකාරය ...................................... 7

13. පොල් ලෙලි කැබලි නිෂ්පාදනය පිළිබඳ දළ සටහනක් ............................ 8

14.පොල් ලෙලි කැබලි ව්‍යාපාරය ආරම්භය සඳහා වැයවන වියදම් ඇස්තමේන්තුව ............................................................................................ 8

15.දිනකට පොල් ලෙලි ව්‍යාපාරයේ ආදායම හා වියදම .............................. 9

16.විදේශීය වෙළඳපොළ..................................................................................... 9

17. සිද්ධි අධ්‍යයනය සඳහා තෝරා ගත් සම්පත් දායකත්වය......................... 9

19. පොල් ලෙලි ව්‍යාපාරයේ හඳුනා ගත් ගැටලු හා යෝජනා ..................... 12

20. දෙපාර්තමේන්තු අපේක්ෂාව :-........................................................... 13

# 1.හැඳින්වීම

සිරිලක කප්රුක යන නාමයෙන් හඳුන්වනු ලබන පොල් ගස ශ්‍රී ලාංකීය ජනතාවගේ ජීවන රටාව හා බද්ධ වී පවතින බෝගයක් වන අතර එය වර්තමානයේ රටපුරා සැබෑම කප්රුකක් බවට පත්ව ඇත. ගෘහස්ත පරිභෝජනය සඳහා මෙන් ම විශාල විදේශ විනිමයක් ඉපයීම සඳහා පොල් ගස ආශ්‍රිත විවිධ නිෂ්පාදනයන් නිෂ්පාදනය කරනු ලබන කර්මාන්තකරුවන්ට ද හිමිවනුයේ තරඟකාරී සුවිශේෂී ස්ථානයකි. ඒ අතර කොහු, කොහු ලණු, කොහු මෙට්ට, පාපිසි, ලණු පැදුරු හා කොහු බුරුසු නිෂ්පාදනය කිරීමට යොදා ගත් පොල් ලෙල්ල මේ වන විට කපා අපනයනය කිරීමෙන් හොඳ ආදායමක් උපයා දෙන කර්මාන්තයක් බවට පත් වී ඇත.

දෙස් විදෙස් රටවල් නිරන්තරයෙන් ම අවධානය යොමු කරන්නේ පරිසර හිතකාමී නිෂ්පාදන සඳහාය. ඒ අනුව 7mm, 8mm, 9mm, 10mm ලෙස කැබලි වලට වෙන් කරන මෙම පොල් ලෙලි දේශීය වෙළඳපොළ තුළ විවිධ වගාවන් සඳහා භාවිතා කරනු ලබන අතර විශේෂයෙන් විශාල ඉල්ලුමක් පවතින විසිතුරු මල් වගාවන් වන ඕකිඩ් හා අන්තූරියම් සඳහා යොදාගනු ලැබේ. විදේශ රටවල මහා පරිමාණ වගා කටයුතු සිදු කරනු ලබන්නේ ආරක්ෂිත ගෘහයන් තුළය.මෙම වගාවන් භූමිය ආශ්‍රිතව සිදු නොකරන අතර වගාව සඳහා සකස් කරන ලද වගා මලු භාවිතා කරනු ලැබේ. වගා මලු තුළ සිදු කරන වගාව සඳහා පස් වෙනුවට යොදා ගනු ලබන්නේ පොල් ලෙලි කැබලි හා කොහු බත් වලින් සකස් කර ගන්නා වගා මාධ්‍යයන්ය. ශ්‍රී ලංකාවේ ද වගාවන් සඳහා මෙම වගා මාධ්‍ය භාවිතයට ගනු ලබන අතර අපනයනයට ද භාවිතා කෙරේ.

ශ්‍රී ලංකාවේ විශාලතම අපනයන ගමනාන්තයන් ලෙස චීනය, මැලේසියාව, සිංගප්පූරුව, ඉන්දියාව, ජපානය, හා අප්‍රිකාව මෙම නිෂ්පාදන සඳහා ප්‍රමුඛ ඉල්ලුම් කරුවන් බවට පත් වී ඇත්තේ පරිසර හිකාමී බව සේම ගෘහ ආශ්‍රිත මෙන් ම මහා පරිමාණ කෘෂිකර්මාන්ත කටයුතු සඳහා ද පහසුවෙන් උපයෝගී කර ගත හැකි මාධ්‍යයක් ලෙස භාවිතා කිරීමට ඇති හැකියාව නිසයි. කාලයක් නිසි ලෙස භාවිතයට නොගෙන අපතේ ගිය සම්පතක් වූ පොල් ලෙලි කැබලි සඳහා දේශීය ඉල්ලුමද ඉහළ ගොස් ඇති අතර පොල් ලෙලි සැපයීම, එකතු කිරීම, කැපීම ආදී වශයෙන් කර්මාන්ත ද විවිධාංගීකරණය වීම හේතුකොට ගෙන පොල් ලෙලි ආශ්‍රිත කර්මාන්තය මෙලෙස දියුණු වී ඇත.

## 2.පසුබිම

තිරසර සංවර්ධනය සහ නවෝත්පාදනය සඳහා පහසුකම් සැලසීම මඟින් දරිද්‍රතාවය මැඩපැවැත්වීම මත සඵලදායී කාර්යභාරයක් සිදු කිරීම හේතුවෙන් නැගී එන සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන්හි සංවර්ධන ක්‍රියාවලියට ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වල දායකත්වය විශේෂයෙන් ම වැදගත් වේ. සාමාන්‍යයෙන් ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර බොහෝමයක් ග්‍රාමීය සහ අඩු ආදායම්ලාභී ප්‍රදේශ පුරා විහිදී පවතී. ලෝක ජනගහන වර්ධනය හේතුවෙන් 2030 වන විට මිලියන 600 ක පමණ රැකියා අවශ්‍යවනු ඇතැයි ලෝක බැංකුව මඟින් ඇස්තමේන්තු ගත කර ඇත.

2021 වර්ෂය  වන විට  ශ්‍රී ලංකාවේ මුළු ජනගහනය මිලියන 22.156 ක් වූ අතර නව රැකියා අවස්ථා උත්පාදනය වීම හේතුවෙන් 2020 වසරේ 5.5% ක් වූ සේවා වියුක්ත අනුපාතය 2021 වසර වන විට 5.1% ක් දක්වා පහළ ගොස් ඇත. එසේ වුව ද සේවා වියුක්ත අනුපාතයෙන් තරුණ සේවා වියුක්තිය (අවුරුදු 15-24) 2020 වර්ෂයේ දී 26.5% ක් වූ අතර 2021 වර්ෂයේදී එම අගය නොවෙනස්ව පැවතුණි. තරුණ සේවා වියුක්තිය අවම කර ගැනීමටත්, වර්තමානයේ පවතින ආර්ථික අභියෝගයන් ජය ගැනීමටත් විරැකියා ප්‍රශ්නයට තිරසර විසඳුමක් ලෙසත් විදේශ වෙළඳපොළ ජය ගැනීමටත් ස්වයං රැකියාවක් ලෙස පොල් ලෙලි කැබලි කිරීමේ ව්‍යාපාරය මහත් පිටුවහලක් වනු ඇත.

## 03.අධ්‍යයනයේ මූලික අරමුණු

- පොල් ලෙලි කැබලි කිරීමේ නිෂ්පාදනය ආශ්‍රිත ආර්ථික ශක්‍යතාවය හැදෑරීම.
- රැකියා මාර්ගයක් ලෙස නිරත වීමට අවශ්‍ය මූලික සුදුසුකම් (අවශ්‍යතා) හැදෑරීම.
- පවුලක මාසික වියදම ඉපයීම සඳහා නිෂ්පාදනයේ නිරතවිය යුතු ආකාරය පිළිබඳ නිර්දේශ ලබා දීම.
- වෙළඳපොළ සම්බන්ධීකරණයන් ගොඩනගා ගැනීමට අවශ්‍ය පසුබිම හඳුනා ගැනීම.

## 04.අධ්‍යයනයේ වැදගත්කම

- ශ්‍රම වෙළඳපොළ තුළ පවතින විරැකියාව අවම කර ගැනීමට රැකියා අවස්ථා නිර්මාණය කිරීම.
- පවුලේ සාමාජිකයින් සම්බන්ධ කර ගනිමින් ආරම්භ කර හොඳ ආදායමක් උපයා ගත හැකි වීම.
- පොල් ලෙලි කැබලි නිෂ්පාදන පිළිබඳ මහජනතාව දැනුවත් කර ඒ සඳහා දිරිමත් කිරීම.
- දේශීය ආර්ථිකය ගොඩනැංවීමට දායක වීම.

## 05.මෙම ව්‍යාපාරය ආරම්භ කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු

I. වියළි දේශගුණයක් සහිත ප්‍රදේශයක් වීම. (හිරු එළිය ඉතා වැදගත්)
II. අමු ද්‍රව්‍ය සපයා ගැනීමේ පහසුව.
III. පොල් ලෙලි කැබලි කිරීමට යන්ත්‍රයක් මිල දී ගැනීම.
IV. කපනු ලබන පොල්ලෙලි කැබලි වියළීම සඳහා සැලකිය යුතු ඉඩ ප්‍රමාණයක් සහිත වීම.
V. ආරම්භයේ දී ශ්‍රමය සඳහා සේවකයින් දෙදෙනෙක් ප්‍රමාණවත් වේ. (පොල් ලෙලි රැගෙන ඒමට සහ යන්ත්‍රයෙන් පොල් ලෙලි කැබලි කිරීමට)
VI. කැබලි කිරීමට භාවිතා කරනු ලබන යන්ත්‍රයෙන් ශබ්දයක් නිකුත් වන නිසා ඒ පිළිබඳ සැලකිලිමත් වීම.
VII. නිෂ්පාදන අලෙවි කර ගැනීමට වෙළඳපොළ පිළිබඳ දැනුවත්භාවයක් තිබීම.

## 06.අමු ද්‍රව්‍ය ලබා ගැනීම

පොල් ලෙලි වෙනත් පාර්ශවයකින් ලබා ගැනීමේ දී ක්‍රම දෙකක් යටතේ ලබා ගනු ලැබේ. එනම් ,

I. DC පොල් - පොල් ගෙඩි පිටින් ගොඩ ගසා දවස් 21 ක් හෝ මාසයක් පමණ තබා පොල් ගෙඩියේ මුඩ්ඩ ඉතිරි නොවන ලෙස පොල් ලෙල්ල ලබා ගැනීම.

II. මාළු පොල් - අමු පොල් වල මුඩ්ඩ කුඩා ප්‍රමාණයක් ඉතිරි වන ලෙස පොල් ලෙල්ල ලබා ගැනීම.

ඉහත ක්‍රම දෙක යටතේ ලබා ගන්නා පොල් ලෙලි කැබලි කිරීමට ගන්නා තෙක් මුනින් අතට අසුරා තබනු ලැබේ.

## 07.පොල් ලෙලි කැබලි කරගනු ලබන යන්ත්‍රය සවි කිරීම

අඩි දෙකක් පමණ උස කොන්ක්‍රිට් තට්ටුවක් හෝ කොන්ක්‍රිට් කණු 04 ක් ආධාරයෙන් සකස් කර ගත් භූමියක් මේ සඳහා යෝග්‍ය වේ. එමඟින් කම්පනය ( vibrate) වීම වළක්වා ගත හැකි අතර කපන කැබලි ඉවත් කර ගැනීමට ද පහසු වේ.



**පොල් ලෙලි කැබලි කිරීමේ යන්ත්‍රය සවි කරන ආකාරය**

## 08.පොල් ලෙලි කැබලි කර ගැනීමට පෙර සකස් කර ගන්නා ආකාරය

පොල් ලෙල්ලක් ඉරු 4 ක් හෝ 5 කින් සමන්විත වේ. පොල් ලෙලි වෙන වෙන ම තීරු ලෙස සකස් කර එක් තැනකට එකතු කර ගත යුතුය. එසේ කිරීමෙන් ඉක්මනින් කුඩා කැබලි කපා ගැනීමට පහසු වන අතර කාලය ඉතිරි කර ගත හැකිය. පොල් ගෙඩියේ ලෙල්ල තීරු වලට වෙන් කර ගැනීමේ දී ඒ සඳහා කම්මලකින් සකස් කර ගත් පිහියක් ලීයක රඳවා මේ සඳහා යොදා ගත හැකිය.



පොල් ලෙල්ල





පොල් ලෙලි ඉරු

## 09.කැබලි කිරීමට පොල් ලෙලි සකස් කර ගැනීම

සාමාන්‍යයෙන් දවසට පොල් ලෙලි 3000 ක් පමණ කැබලි කර ගත හැකි අතර එයින් 1000Kg ක් සකස් කර ගත හැක. මේ සඳහා පොල් ලෙලි හොඳින් පදම් කර ගත යුතු අතර ඒ සඳහා ක්‍රම 03 ක් භාවිතා කරනු ලැබේ.

- ❖ පොල් ලෙලි කැබලි කිරීමට පැය දෙක තුනකට පෙර වියළි පොල් ලෙලි වටේට අතුරා මැද වතුර මලක් සවි කර වතුර විහිදීමට සැලැස්වීම.
- ❖ වියළි පොල් ලෙලි වලට පෙර දින වතුර හොඳින් ස්ප්‍රේ කර පසු දින කැපීම.
- ❖ වියළි පොල් ලෙලි වලට හොඳින් වතුර යොදා අඩි 25*25 ඉටිකොළයක් ඊට උඩින් එළනු ලැබේ. එවිට පොල් ලෙලි තැම්බෙන ස්වභාවයක් ගන්නා අතර එවිට ඉතා පහසුවෙන් කැබලි කිරීමට හැකිය.

## 10.කපනු ලබන පොල් ලෙලි කැබලි ප්‍රමාණ

7mm, 8mm, 9mm, 10mm ලෙසම්ල දී ගනු ලබන ආයතන වල ඉල්ලීම පරිදි කැබලි සකස් කර දෙනු ලැබේ.




කපනු ලබන පොල් ලෙලි කැබලි ප්‍රමාණ

## 11.පොල් ලෙලි කැබලි Wash සහ Unwash කිරීම

| | Wash කරන අකාරය | වාසි | අවාසි |
|---|---|---|---|
| Wash කිරීම | • කැබලි කර ගන්නා පොල් ලෙලි ප්‍රමාණය අනුව ටැංකියක් හෝ ජලය ඇති ස්ථානයක් සකස් කර ගැනීම.<br>• පොල් ලෙලි කැබලි උර වලට අසුරා දිනක් පමණ ජලයේ ගිල්වා තැබීම .<br>• ජලය ඉවත් කර නැවත ජලය පුරවා පැය දෙකක් පමණ තබා නැවත ජලය ඉවත් කරනු ලැබේ.<br>• ඉන් පසු දින දෙකක් පමණ හොඳින් අව්වේ වියළා ගැනීම. | • මේ සඳහා හොඳ වෙළඳපොළ ඉල්ලුමක් පැවතීම.<br>• ඉහළ මිළක් පැවතීම. | • ඉඩකඩ සහ ජලය වැඩිපුර අවශ්‍ය වීම.<br>• වියළීමට වැඩි කාලයක් ගත වීම. |

| | | | |
|---|---|---|---|
| UnWash කිරීම | • අවශ්‍ය ප්‍රමාණයේ කැබලි කපා හොඳින් තුනී කර වියළා ගැනීම. | • පහසුවෙන් වියළා ගත හැකි වීම. | • Wash කරන ලද කැබලි වල මිලට වඩා අඩු මිලක් ලැබීම. |

## 12.කපා ගත් පොල් ලෙලි කැබලි වියළන ආකාරය

මේ සඳහා ක්‍රම දෙකක් භාවිතා කරනු ලැබේ.

I. සිමෙන්ති යොදා සමබිමක් සකස් කර එහි වියළීම.(මේ සඳහා වෙනම ම වියදමක් දැරීමට සිදු වේ)
II. ඉටි කවර ආධාරයෙන් වියළා ගැනීම.(අඩි 25*25 කවර 04ක් තිබීම ප්‍රමාණවත් වේ.)

පොල් ලෙලි 2000 ක පමණ කැබලි වියළීම සඳහා අඩි 50 * 60 ප්‍රමාණයේ ඉඩක් (සම්පූර්ණ වර්ග අඩි 3000 ක් ) ප්‍රමාණවත් වන අතර හොඳින් තුනී කර හිරු එළිය හොඳින් පවතී නම් පැය 05 කින් පමණ එහා මෙහා පෙරළමින් ඉතා හොඳින් වියළා ගත හැකිය. වියළි පොල් ලෙලි කැබලි වල අඩංගු තෙතමනය මනිනු ලැබේ. මේ සඳහා විද්‍යුත් උපකරණ දෙකක් භාවිතා කරනු ලැබේ.

I. තෙතමන ප්‍රමාණය වර්ණ ආශ්‍රයෙන් දක්වන උපකරණය (මේ යටතේ වර්ණ තුනක් භාවිතා කරනු ලැබේ.)
    - 16 – 22 අතර කොළ වර්ණය
    - 23 – 26 අතර නිල් වර්ණය
    - 27 ට වැඩි රතු වර්ණය

මෙම වර්ණ වලින් වැඩි ඉල්ලුමක් පවතින්නේ 16 – 22 ත් අතර තෙතමනය සහිත පොල් ලෙලි කැබලි සඳහාය.

II. විද්‍යුත් සන්නායක උපකරණය (Moisture Meter)
මෙම උපකරණය මඟින් පොල් ලෙලි කැබලි වල අඩංගු තෙතමනය එකවරම මනිනු ලැබේ. මෙහි දී තෙතමනය සෙල්සියස් අංශක 25 ට අඩු පොල් ලෙලි කැබලි සඳහා වැඩි ඉල්ලුමක් පවතී.

## 13. පොල් ලෙලි කැබලි නිෂ්පාදනය පිළිබඳ දළ සටහනක්



පොල්ලෙලි මිලදී ගැනීම



යන්ත්‍රානුසාරයෙන් කපා ගැනීම



කපා ගත් පෙල්ලෙලි වියළා ගැනීම





කපාගත් කැබලි විවිධ ප්‍රමාණයන් අනුව ඇසිරීම



වෙළඳපොළ වෙත බෙදා හැරීම

## 14.පොල් ලෙලි කැබලි ව්‍යාපාරය ආරම්භය සඳහා වැයවන වියදම් ඇස්තමේන්තුව .

| | |
|---|---|
| පොල් ලෙලි කැබලි කිරීමේ යන්ත්‍රයක මිළ | - රු : 450,000.00 (මේ සඳහා විශාල මුදලක් වැය වන බැවින් භාවිතා කරන ලද මැෂිමක් රු : 50,000.00 සිට මිල දී ගත හැකිය.) |
| පොල් ලෙලි මැෂිම සවි කිරීමට හා කැබලි කපා ගැනීම සඳහා සුදුසු ගොඩනැගිල්ලක් සකස් කර ගැනීම | - රු : 50,000.00 |
| කැබලි වියළීම සඳහා ඉටි කවර (25*25) කවර 04 ක් මිදී ගැනීම ( රු: 3000*4 ) | - රු : 1,2000.00 |

## 15.දිනකට පොල් ලෙලි ව්‍යාපාරයේ ආදායම හා වියදම

| ආදායම | වියදම |
|---|---|
| වියළි පොල් ලෙලි කැබලි 1Kg ක් රු:40.00 බැගින් 1000Kg කට මිළ = රු : 40,000.00 | පොල් ලෙලි 3000 (රු:8 *3000) = රු : 2,4000.00<br>සේවක කුලී (රු:1500 *4 ) = රු : 6,000.00<br>විදුලි බිල / කෑම වියදම = රු : 2,000.00<br>ප්‍රවාහන වියදම්<br>( මෙය ප්‍රවාහන දුර ප්‍රමාණය අනුව වෙනස් වේ.) = රු : 1000.00<br>=රු: 33,000.00 |
| ලාභය<br>රු : 40,000.00 - රු : 33,000.00 = **රු: 7,000.00** | |

(ඉහත සඳහන් මිල ගණන් 2022 ඔක්තෝම්බර් මස මිළ ගණන් අනුව සකසා ඇත.)

## 16.විදේශීය වෙළඳපොළ

| පොල් ලෙලි කැබලි ප්‍රමාණය (1Kg ) | මිළ (ඩොලර් - $) | මිළ (රුපියල් ) ඩොලරයේ මිල රු 360 දී |
|---|---|---|
| ඔකිඩ් මල් වගාව සඳහා පොල් ලෙලි කැබලි | 46.79 | 16,844.40 |
| ඇන්තූරියම් මල් වගාව සඳහා පොල් ලෙලි කැබලි | 80.00 | 28,800.00 |

## 17. සිද්ධි අධ්‍යයනය සඳහා තෝරා ගත් සම්පත් දායකත්වය

| සම්පත් දායකත්වය | ලිපිනය | දුරකථන අංකය |
|---|---|---|
| ප්‍රදීප් මහේන්ද්‍ර බාලසූරිය | මාදෙල්ගමුව, බටපොත | 0774910975 |

## ප්‍රදීප් මහේන්ද්‍ර බාලසූරිය මහතාගේ පොල් ලෙලි කැබලි කිරීමේ ව්‍යාපාරය පිළිබඳ විවරණය

2020 වර්ෂයේ ආරම්භ කරන ලද මෙම ව්‍යාපාරය දේශීය මෙන්ම විදේශීය වෙළඳපොළ ඉලක්ක කර ගනිමින් සකස් කරනු ලැබේ. රුපියල් 265,000 ක මුදලක් වියදම් කර මෝටර් දෙකක් සහිත පොල් ලෙලි කැබලි කිරීමේ යන්ත්‍රයක් මිලදී ගනිමින් සේවකයින් හතර දෙනෙකුට රැකියා අවස්ථා ලබා දෙමින් ඉතා සාර්ථක ලෙස මෙම ව්‍යාපාරය සිදු කරනු ලැබේ. යන්ත්‍රය සවි කර ගැනීමට හා පොල් ලෙලි කැබලි කිරීමට කුඩා ගොඩනැඟිල්ලක් සකස් කර ගත් අතර ඒ සඳහා රුපියල් 50,000 ක පමණ මුදලක් වැය කොට ඇත. සතියකට පොල් ලෙලි කැබලි 6000Kg ක ප්‍රමාණයක් සකස් කර ගන්නා අතර Wash කරන ලද කැබලි 1Kg ක් රුපියල් 58.00 බැගින් ද Unwash කැබලි 1Kg ක් රුපියල් 48.00 බැගින් ද මිල දී ගන්නා ආයතනය වෙත ලබා දෙනු ලැබේ. එක් කවරයකට 7Kg ත් 9Kg ත් අතර ප්‍රමාණයකින් යුක්තව කැබලි අසුරා ලබා දෙනු ලැබේ. ව්‍යාපාරය ආරම්භක මුල් කාලයේ දී මාසික විදුලි බිල සඳහා රුපියල් 8,000 ක් පමණ වැය වූ අතර වර්තමානයේ රටේ සිදුවන ආර්ථික වෙනස්වීම් තත්වය හේතුවෙන් එය රුපියල් 12,000 ක් දක්වා වැඩි වී ඇත. පොල් ලෙලි 1000 ක් කැපීමට පැය තුනක පමණ කාලයක් ගත වනු ලැබේ. මීට අමතරව පොල් ලෙලි කැබලි යොදා ගනිමින් සකස් කරනු ලබන වෙනත් වගාවන් සඳහා (විශේෂයෙන් ඕකිඩ් හා ඇන්තූරියම් වැනි මල් වගාවන් සඳහා) 1Kg ක් රුපියල් 100 බැගින් විකුණුම් කරනු ලැබේ. එමෙන් ම කුඩා ට්‍රැක්ටර් එකක ප්‍රමාණයක් රුපියල් 5,000 ක් වැනි මුදලකට ලබා දෙනු ලැබේ. වර්ෂාවෙන් බාධාවක් නොමැතිව මාසිකවම මෙම රැකියාවේ නියැලීමට හැකි නම් හොඳ ලාභයක් උපයා ගනිමින් වර්තමාන ආර්ථික තත්වයන්ට මුහුණ දීමේ හැකියාව ඇති ඉතා සාර්ථක ව්‍යාපාරයකි.



**Unwash කැබලි 1Kg**



**මල් සඳහා පොල් ලෙලි කැබලි යෙදීම**

# 18. පොල් ලෙලි කැබලි කරන යන්ත්‍ර මිල දී ගත හැකි ආයතන හා පොල් ලෙලි කැබලි මිල දී ගන්නා ආයතන

| පොල් ලෙලි කැබලි මිල දී ගන්නා ආයතන | පොල් ලෙලි කැබලි කරන මැෂින් මිල දී ගත හැකි ආයතන |
|---|---|
| **Hayleys Lanka(pvt) Ltd,** No.400, Deans Road, Colombo 10.<br>Te: 0112627000 | <br>**D & S Engineers,** Kuliyapitiya<br>Te: 0713814404 |
| <br>**Jayampathi Lanka(pvt) Ltd,** Dambulla Road, Muttettugala, Kurunegala<br>Te: 0372224068 | <br>**Dileepa Engineers** , Kurunagela<br>Te: 0761874709 |
| **Coco Agro (pvt) Ltd,**<br>No:203, Marapola, Udugampola, Divulapitiya Road, Veyangoda.<br>Tel: 9493398058 | <br>**Coco Dreams Lanka**, Chilaw Rd, hammaligedara, Bandarakoswatta<br>T.P: 0764103180<br>WhatsApp 0776274668 |

## 19. පොල් ලෙලි ව්‍යාපාරයේ හඳුනා ගත් ගැටලු හා යෝජනා

| ගැටලු | යෝජනා |
|---|---|
| ❖ වර්තමානය වන විට මෙම ව්‍යාපාරය ආරම්භ කිරීමට බලාපොරොත්තු වන අයට යන්ත්‍රයක් ලබා ගැනීමට අධික මුදලක් වැය කිරීමට සිදු වීම. | ❖ සහනදායී ණය ක්‍රමයක් යටතේ අවශ්‍ය යන්ත්‍රය ලබා ගැනීමට අනුග්‍රහය ලබා දීම. |
| ❖ ව්‍යාපාරය පිළිබඳ දැනුවත්භාවයක් නොමැති වීම . | ❖ මෙම ව්‍යාපාරය පිළිබඳ Online Marketing හරහා පාරිභෝගිකයා දැනුවත් කර ඒ සඳහා හොඳ වෙළඳපොළක් සකස් කර දීම |
| ❖ වෙළඳපොළ අවස්ථා සොයා ගැනීමේ අපහසුව. | ❖ ප්‍රධාන අපනයන කරුවන් සමඟ සම්බන්ධතා ජාල ගොඩනඟා ගැනීම. |
| ❖ ඉල්ලුමට සරිලන පරිදි සැපයුම ප්‍රමාණවත් නොවීම. | ❖ මෙම ව්‍යාපාරය පිළිබඳ දැනුවත් කර නව ව්‍යවසායකයින් බිහි කිරීම. |

## 20. දෙපාර්තමේන්තු අපේක්ෂාව :-

ශ්‍රම වෙළඳපොල ව්‍යවසායක අවස්ථා බහුල කොට, සේවා නියුක්තිය හා ආදායම් උත්පාදන හැකියාවන් වර්ධනය කිරීමට සුදුසු ආයෝජන අවස්ථා ව්‍යවසායකයින් වෙත හඳුන්වා දීම ඉලක්ක කර ගත් පර්යේෂණ වැඩසටහනක එක් ප්‍රතිඵලයක් ලෙස මෙම වාර්තාව ඔබ වෙත ඉදිරිපත් කෙරෙන අතර, ඔබෙත්,රටේත් උන්නතිය සඳහා මෙවැනි අවස්ථා භාවිතා කරනු ඇතැයි මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව අපේක්ෂා කරයි.

මූලාශ්‍ර :

- මහ බැංකු වාර්තාව - 2021
- https://www.facebook.com/784395781944128/photos/a.895685880815117/1100027773714259/?type=3
- https://www.youtube.com/watch?v=djw6A8YcebU
- https://www.youtube.com/watch?v=QjkwNgubxq0
- https://www.youtube.com/watch?v=k6EaGzNkgBg
- https://www.youtube.com/watch?v=RrwYhqAv6G4
- https://www.youtube.com/watch?v=79th3xkXjRs&t=737s